හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව - 2021

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබෙද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 3.7 ප්‍රකාරව අස්ථිත්වයක් එම කාලපරිච්ඡේදයට අදාළව පිළියෙල කළ අයවැය ලේඛනවල අයවැයගත තොරතුරු සහිතව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළයුතු වුවත් ප්‍රාදේශීය සභාවේ සමාලෝචිත වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සටහන් හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය අයවැයගත තොරතුරු රහිතව ඉදිරිපත් කර තිබුණි. | පිළිගනිමි. | ගිණුම් නිවැරදිව පිළියෙල කළයුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ ක්ෂය ගණනය කිරීමේදී ක්ෂය දෙගුණයකින් ගණනය වී තිබුණු අතර එම වටිනාකම නිවැරදි නොකිරීම නිසා එම ක්ෂය වෙන්කිරීමේ වටිනාකම රු.18,941,715 කින් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | පෙර වර්ෂ ගැලපීම් නිවැරදිව සිදුකළයුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන නොවන රු.41,529,584 ක් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර තිබුණි | | |
| (ඇ) | ඉකුත් වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් රු.10,995,500 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශයේ දක්වා තිබුණි. | | ගිණුම් නිවැරදිව පිළියෙළ කළයුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරුකිරීම් රු.293,370 ක් වුවත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ එය රු.81,109,035 ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉටු නොකළ හා අත්හළ ව්‍යාපෘති සඳහා ණයගැතියන් ලෙස රු.11,435,263 ක්ද ඉටුනොකළ ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු ණයහිමියන් ලෙස රු.15,938,019 ක්ද ගිණුම්ගත කර තිබුණි. | | සහතික කළ වැඩ වටිනාකම් පමණක් ගිණුම්ගත කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ඉකුත් වර්ෂයේ වෙන්කිරීම් කරන ලද විගණන ගාස්තු රු.135,000 කින් සමාලෝචිත වර්ෂයේදී රු.129,900 ක් ගෙවීම් කිරීමේදී නැවත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. | නිවැරදිව ගිණුම් පිළියෙළ කළයුතුය. |
| (උ) | පළාත් පාලන ආයතන සඳහා වු ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය පරිශිෂ්ඨය- 2 හි සඳහන් ගිණුම් කේතක 200-299 ජංගම වත්කම් යටතේ 205 පුස්තකාල පොත් ලෙස සඳහන් කර තිබුණු නමුත් ප්‍රාදේශීය සභාවේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.1,722,041 ක් වු පුස්තකාල පොත් පිළිබඳව වත්කම් වගකීම් ප්‍රකාශයේ හෝ සටහන් තුළින් හෝ හෙළිදරව් කර නොතිබුණි. | | |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| වත්කම් හා වගකීම් ගිණුම් විෂයයන් 07 ක හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගිණුම් විෂයයන් 03 ක ශේෂයන් අනුරූපි වාර්තා සමඟ සැසඳීමේදී රු.101,894,276 ක වෙනසක් පැවතුණි. | පිළිගනිමි. | නිවැරදිව වටිනාකම් ගිණුම්ගත කළයුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අක්‍රිය තත්ත්වයේ පවතිරු.1,390,000 ක්වූ වාහන 11 ක් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී වෙන්දේසි කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළයුතු වේ. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අංක 3.1 වගන්තිය | සභාව සතු සක්‍රිය වාහන 04 ක ඉන්ධන දහන පරීක්ෂාවක් කර නොතිබුණි. | ඉන්ධන පරීක්ෂාව සිදුකිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ අයභාරය රු.24,094,849 ක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ අයභාරය ඉක්මවූ වියදම රු.16,486,566 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,089,450 ක්වූ හිඟ, කසළ බදු අයකර ගැනිමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ආ) | **කුලී**<br>----- | | |
| (i) | වසර 01 - 09 අතර කාලයක සිට කඩකාමර 19 කින් අයවී නොමැති හිඟ කඩකාමර කුලී රු.1,098,930 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | හිඟ මුදල් අයකර ගැනිමට කටයුතු කළයුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වසර 01 - 03 ත් අතර කාලයක සිට වත්කම් කුලියට ලබාදීම මත අයවිය යුතු කුලී මුදල රු.777,787 ක්ද වත්කම් බදුදීම් මත අයවිය යුතු රු.5,519,457 ක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සොයා බලා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | හිඟ මුදල් අයකර ගැනිමට කටයුතු කළයුතුය. |
| (ඇ) | **බලපත්‍ර ගාස්තු**<br>---------------- | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,035,300 ක්වූ හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ ගිණුම් තුලින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | සාක්ෂි සහිතව ගිණුම් නිවැරදිව කිරීමට කටයුතු කළයුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හොරොව්පොතාන නගරයේ ඉටුනොකර අත්හැර දමා තිබුණ ව්‍යාපෘති 02 ක කාර්ය සාධන බැඳුම්කරය කල්ඉකුත් වීම නිසා රු.1,228,789 ක් අහිමිවී තිබුණි | පරීක්ෂා කර බලා ඉදිරියේදී කටයුතු කරමි. | අලාභ වගකිවයුතු පාර්ශ්වයන් අයකර ගැනිමට කටයුතු කළයුතුවේ. |
| (ආ) | සභාවට අයත් කැබ්රථයක් 2019 මාර්තු මස අනතුරකට ලක්වීම හේතුවෙන් අළුත්වැඩියා වියදම් ලෙස රු.336,952 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි .මෙම අලාභයට වගකිවයුතු පාර්ශවයන් තීරණය කිරීම සඳහා මු.රෙ. 104 නිරීක්ෂණයන් සිදුකර නොතිබුණි. | සභා අනුමැතිය ලැබීම හේතුවෙන් ගෙවීමට සිදු වී ඇත. | |

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 හා 2021 වර්ෂයේ වත්කම් බදුදීම් සම්බන්ධයෙන් ලැබිය යුතු ආදායම් රු.2,385,644 ක් සභා තීරණ මත පදනම්ව ආණ්ඩුකාර වරයාගේ අනුමැතිය ලබානොගෙන සමාලෝචිත වර්ෂයේදී කපාහැර තිබුණි. | මාස 04 දින 7 ක කාලයක් සඳහා සභා අනුමැතියක් යටතේ ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන ලදි. | ලැබිය යුතු ආදායම් කපාහැරීම සඳහා විෂයභාර අමාත්‍යවරයා වෙනුවට ආණ්ඩුකාර වරයාගේ අනුමැති ලබාගත යුතු වේ. |

## 3.3 ව්‍යාපෘති, කර්තව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - 2021 යටතේ රු.89,000,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු ව්‍යාපෘති 52 ක් ගිවිසුම්ගතවීමෙන් පසු අත්හැර දමා තිබුණි. | මෙම ව්‍යාපෘති අවලංගු කර ඇත. | ප්‍රතිපාදන වෙන්කරන ලද ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී රු.18,718,416 කට ගිවිසුම්ගත වු ව්‍යාපෘති 03 ක් සඳහා රු.425,011 ක් වියදම් කර තිබු නමුත් එම ව්‍යාපෘති 2021 දෙසැම්බර් 31 දින වනවිට අත්හැර දමා තිබුණි. | ව්‍යාපෘතිය ආරම්භ කරන අවස්ථාව වන විට රටේ පැවති භාණ්ඩ හිඟය සහ මිල විචලනය හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිකිරීම් නොකරන ලදී. | ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවන්ට එරෙහිව කටයුතු කළයුතු වේ. |